# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2266/3 – 2022 පෙබරවාරි මස 07 වැනි සඳුදා – 2022.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 08 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2020/HW/292.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/අත්පත්/විදුලි රැහැන්/III.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මල්ලවපිටිය.

2. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක 717, පල්ලෙ ගැට්ටුවාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පහළ ගැට්ටුවාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක KU/MLL/2021/82 හා 2021.07.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 2 – වැලිකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0196**
උතුරට, නැගෙනහිරට සහ දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

EOG 02 – 0381